#mediaethicesSL #SinhalaPress #Mawbima #Sinhalamedia #Tamilmedia #SirasaNews #SwarnavahiniNews #AdaDeranaNews #SiyathaNews #ShakthiNews #HiruNews #lka

පසුගිය දින කල්මුණේ සායින්දමරුදු ප්‍රදේශයේ සිදුවූ සිදුවීමෙහිදී මරාගෙන මැරෙන බෝම්බකරුවන් විසින් නිකුත් කොට තිබූ වීඩියෝපටයේ අන්තර්ගතයන් තෝරාගත් පුවත්පත් සහ රූපවාහිනී නාලිකාවන් මගින් ප්‍රකාශයට පත් කර තිබුණේ පහත දැක්වෙන ලෙසටයි. මෙම වීඩියෝ පටය හෝ එහි අන්තර්ගතය ප්‍රකාශයට පත් කිරීම ඔස්සේ තවත් අයවලුන් ප්‍රචණ්ඩත්වය කරා කැඳවීමට පෙළඹවීමක් සිදුකෙරෙනු ඇතැයි කතිකාවක් පැන නැගිණි. මෙහිදී සිහිපත් කළ යුත්තේ මෙම වසරේ නවසීලන්තයේ සිදුවූ ක්‍රයිස්ට්චර්ච් වෙඩිතැබීමේදී අදාළ අපරාධකරු විසින් නිකුත් කළ වීඩියෝවද ප්‍රචාරය නොකොට වාරණය කිරීමට එරට ජනමාධ්‍ය මගින් ගෙන තිබූ තීරණයයි. සායින්දමරුදු මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ වීඩියෝවද ඇතැම් නාලිකාවන් මගින් ප්‍රකාශයට පත් කළත්, පසුව හෝ ඒ ඉවත් කිරීමට කටයුතු කර තිබීමද ප්‍රශංසා කටයුතු වේ. මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?